# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2154/58 - 2019 දෙසැම්බර් මස 21 වැනි සෙනසුරාදා - 2019.12.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීම**

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/2/2016/ඒ/402.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය : බී. ඩී./එච්. ඩී./එල්. එන්. ඩී./03/01/පී.ඕ.කිව්.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති නිලධාරි නිල නිවසක් සඳහා ඉඩම් අත්කර ගැනීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තරය* :

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හල්දුම්මුල්ල කොට්ඨාසයේ, අංක 155 එච්, රණසිංහගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ රණසිංහගම ගමේ පිහිටි, මැනුම් අධිකාරි විසින් පිළියෙළ කරන ලද 2019.08.27 දින දරන මූ.පි.බ. 729 පිඹුරේ පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2000ක් පමණ වූ ඉඩම්වල විස්තර පහත දැක්වේ.

**1. කැබලි අංක 1 - ඉඩමේ නම: ලේමස්වත්ත (පෙට්ටිගල කොටස); විස්තරය: මුඩුබිම; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.0330**

*උතුරට* : කඳුර, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන පෙට්ටිගල වත්ත සහ කැබලි අංක 2; *නැගෙනහිරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන පෙට්ටිගල වත්ත, කැබලි අංක 2 සහ 4; *දකුණට* : කැබලි අංක 2, 4 සහ කඳුර; *බටහිරට* : කඳුර.

**2. කැබලි අංක 2 - ඉඩමේ නම: ලේමස්වත්ත (පෙට්ටිගල කොටස); විස්තරය: ගෙවත්ත, අවු 20 -30 පමණ වයසැති මිශ්‍ර වගාවක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.1288**

*උතුරට* : කැබලි අංක 4 සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන පෙට්ටිගල වත්ත; *නැගෙනහිරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන පෙට්ටිගල වත්ත, කැබලි අංක 3 සහ 4; *දකුණට* : කැබලි අංක 3, 4 සහ 1; *බටහිරට* : කැබලි අංක 1.

**3. කැබලි අංක 3 - ඉඩමේ නම: ලේමස්වත්ත (පෙට්ටිගල කොටස); විස්තරය: මුඩුබිම; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.0071.**

*උතුරට* : කැබලි අංක 2, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන පෙට්ටිගල වත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); *නැගෙනහිරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන පෙට්ටිගල වත්ත, මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ කැබලි අංක 04; *දකුණට* : මාර්ගය (ප්‍රාදේශීය සභා), කැබලි අංක 4 සහ 2; *බටහිරට* : කැබලි අංක 2.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**4. කැබලි අංක 4 - ඉඩමේ නම: ලේමස්වත්ත (පෙට්ටිගල කොටස); විස්තරය: මුඩුබිම; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.0311.**

*උතුරට* : කැබලි අංක 1, 2, 3 සහ සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); *නැගෙනහිරට* : මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); *දකුණට* : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ කඳුර; *බටහිරට* : කඳුර, කැබලි අංක 1, 2 සහ 3.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 පෙබරවාරි මස 10 වැනි දින පෙ.ව. 10.00ට හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද 2020 පෙබරවාරි මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

වී. පී. සුනෙත් ජිනේන්ද්‍රසේන,
ප්‍රාදේශීය ලේකම්,
හල්දුම්මුල්ල.

2019 දෙසැම්බර් මස 16 වැනි දින,
හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 - 279

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීම**

මගේ අංකය : BD/WM/LND/2/5/AQUIS/16.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 4-3/9/2016/WS/45.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශ්‍යතාව ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තරය* :

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹවින්න පළාත කෝරළේ සුළු කොට්ඨාසයේ, ගුරුතලාව ගමේ මැනුම්පති විසින් පිළියෙල කර ඇති අ.ග.පි. 189 පත්‍රයේ අංක 30, අතිරේක අංක 20 සහ 2018.08.24 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 621න් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0324ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල :

01. **කැබලි අංක 621**
ඉඩමේ නම: ගොනාගොල්ල; විස්තරය: වතුර ටැංකියක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් සහිත ගෙවත්ත; හිමිකම් කියන අය: රජය, එස්. බදුර්දීන් විසින් අංක ඉ.ස.ආ. 189/252 දරන බලපත්‍රය යටතේ භුක්ති විඳියි; ප්‍රමාණය: හෙක්. 0.0324.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලූ දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය පැවරුණු අයවලුන් හෝ පහත සඳහන් දිනයේ ඒ ඒ ඉඩම කැබලි අංක සඳහා පහත නියම කර ඇති වේලාවට වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

| *දිනය* | *වේලාව* | *ඉඩම් කැබලි අංක* |
|---|---|---|
| 2020.01.27 | පෙ.ව. 10.00 | 621 |

තවද, 2020.01.27 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඩබ්. එම්. සී. වීරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2019 දෙසැම්බර් මස 19 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 - 280

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.